# බඳවා ගැනීමේ පටිපාටිය

සේවා ගණය :- ආශ්‍රිත නිලධාරි

වැටුප් කේතය :- **MN-4**

තනතුර :- ධීවර නිලධාරි

රා.සේ.කො. අනුමත කළ දිනය :- 2015.08.04

## ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි ආශ්‍රිත නිලධාරී සේවා ගණය

## (ධීවර නිලධාරී තනතුර) සඳහා වන

## බඳවා ගැනීමේ පටිපාටිය

01. **සම්බන්ධ වන ආයතන**

| | |
|---|---|
| 1.1 දෙපාර්තමේන්තුව : **ධීවර හා ජලජ සම්පත්** | යොමු අංකය : ධීජසදෙ/ආ02/08/බඳවා ගැනීම් MN4<br>දිනය : 2015.02.12 |
| 1.2 අමාත්‍යාංශය : **ධීවර හා ජලජ සම්පත් සංවර්ධන** | යොමු අංකය : 1/4/1/13/ධී.දෙ/ධී.නි<br>දිනය : 2015.02.26 |
| 1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම: | යොමු අංකය :DMS/1141/Vol II<br>දිනය : 2015.01.01 |
| 1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය : | යොමු අංකය : EST-3/RECRU/03/4745<br>දිනය : 2015.01.12 |
| 1.5 ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය: | යොමු අංකය: NPC/5/36/1/SR-1-II<br>දිනය : 2014.09.11 |
| 1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය: | යොමු අංකය: PSC/EST/05-01-36/01/2015<br>දිනය : 2015.08.04 |

02. **පත් කිරීම් බලධරයා :** රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්

03. **සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 සේවා ගණය : ආශ්‍රිත නිලධාරී

3.2 ශ්‍රේණි : I,II,III

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

ආයතනික අරමුණු ඉටු කිරීමේ කාර්යයන්හි දී විධායක මට්ටම්වල කාර්යභාරයට උපස්ථම්භක වන්නා වූ විමර්ශන ,තොරතුරු හා දත්ත රැස් කිරීම , විශ්ලේෂණය, සම්පාදනය , වාර්තා සම්පාදනය , සමීක්ෂණ වැනි කාර්යයන් අතරින් නියමිත කාර්යභාරයක් සඳහා බඳවා ගැනීමේ මූලික සුදුසුකම් වශයෙන් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් අවශ්‍ය වන්නා වූ කාර්යභාරයන් පැවරෙන සේවා ගණයකි

3.4 කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැකිය.

04. **තනතුරෙහි/තනතුරුවල ස්වභාවය** : ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත

## 05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : MN 4 - 2006 A

5.2 වැටුප් පරිමාණය : රු.15,215-10X215 -4 X240-7 X320-15 X360-25,965

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| 111 | පියවර 01 | රු. 15,215/= |
| 11 | පියවර 12 | රු. 17,605/= |
| 1 | පියවර 23 | රු. 20,925/= |

## 06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්.

| අනුමත තනතුරු නාම | තනතුරු අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන්. |
|---|---|---|---|
| ධීවර නිළධාරී | I,II,III ශ්‍රේණිය | 225 | • ධීවර හා ජලජ සම්පත් පනත හා අදාළ නීති රීති ක්‍රියාත්මක කිරීම.<br>• නීති විරෝධී , වාර්තා නොවන හා නියාමනය නොවන ධීවර ක්‍රියාකාරකම් භාවිතය වැලැක්වීමට වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.<br>• අන්තර්ජාතික /කලාපීය සංරක්ෂණ හා කලමනාකරණ නිර්ණායකයන්ට අනුව ධීවර කටයුතු නියාමනය කිරීම හා පසු අස්වනු තාක්ෂණය භාවිතා කිරීමට ධීවර කාර්මිකයින් යොමු කිරීම.<br>• ධීවර යාත්‍රා සඳහා ලොග් සටහන් පොත් පවත්වාගෙන යාම, අධීක්ෂණය කිරීම හා එම ලොග් සටහන් එක් රැස් කර අදාළ දත්තවල නිරවද්‍යතාවය පරීක්ෂා කර බලා ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කිරීම.<br>• ප්‍රධාන ධීවර වරායන් වෙත පැමිණෙන විදේශීය හා දේශීය ධීවර [illegible] පරීක්ෂා කිරීම හා මත්ස්‍ය අස්වනු ගොඩබෑමේ අවසර පත් ලබා දීම.<br>• දේශීය හා ජාත්‍යන්තර මුහුදේ ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවර යාත්‍රා සඳහා මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම.<br>• සියළුම මත්ස්‍ය වර්ගයන්හි දත්තයන් දෛනිකව, විද්‍යාත්මක ක්‍රමවේදයන්ට අනුව රැස් කිරීම.<br>• වරින් වර අවශ්‍ය වන පරිදි ක්‍රියාත්මක සහනාධාර වැඩසටහන් , ධීවර කර්මාන්තයේ ප්‍රගමණය උදෙසා හඳුන්වා දෙනු ලබන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>• ධීවර ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම සඳහා සුභසාධන සේවා සැළසීම.<br>• සංඛ්‍යා ලේඛන රැස්කිරීම හා අදාල ආයතනයන්ට යොමු කිරීම.<br>• ධීවර ක්ෂේත්‍රයේ ආදායම් ප්‍රේක්ෂණය කිරීම හා බැංකුගත කිරීම.<br>• සහනාධාර යෝජනා හා ව්‍යාපෘති කටයුතු සම්බන්ධව අනෙකුත් රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීම. |

| | | | |
|---|---|---|---|
| | | | • ධීවර සම්මේලනයට අදාලව ධීවර සමිති පිහිටුවීම, ආධාර ලබාදීම හා ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම.<br>• අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන වෙනත් රාජකාරි. |

ඒකාබද්ධ බලධර සංඛ්‍යාව - 225

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II හා I ශ්‍රේණින් සියල්ල ඒකාබද්ධ බලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

## 07. බඳවා ගැනීමේ ක්‍රමය :

### 7.1 බඳවා ගැනීමේ ප්‍රතිශතයන්:

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 50% |
| සීමිත | 50% |
| කුසලතා | අදාළ නොවේ |

සටහන -

I] සීමිත ධාරාවෙන් බඳවා ගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් දෙපාර්තමේන්තුව තුළ නොසිටී නම් ඉතිරි පුරප්පාඩු ප්‍රමාණය විවෘත ධාරාවෙන් බඳවා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන්ම සම්පූර්ණ කරනු ලැබේ.

### 7.2 විවෘත බඳවා ගැනීම :

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම්: විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ජීව විද්‍යාව, ක්ෂුද්‍ර ජීව විද්‍යාව, සත්ත්ව විද්‍යාව, ධීවර විද්‍යාව, ධීවර හා සමුද්‍ර විද්‍යාව, ආහාර විද්‍යාව, ආහාර තාක්ෂණ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.2.2.3 පළපුරුද්ද : අදාළ නොවේ.

7.2.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් මානසික හා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් :

i. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7:2:2 සිට 7:2:3 දක්වා සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 වයස :

7.2.3.1 අවම සීමාව : අවුරුදු 21 ට නොඅඩු

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 35 ට නොවැඩි

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය:

ලිඛිත තරඟ විභාගයක සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයකට සමාන සංඛ්‍යාවක්, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය කර ලිඛිත විභාගය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ යන දෙකේම ඒකාබද්ධ ලකුණු වල කුසලතා අනුපිළිවෙලින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය -

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| 2. රචනය හා සාරාංශය | 100 | 40% |
| 3. සාමාන්‍ය දැනීම | 100 | 40% |

(විෂය නිර්දේශය ඇමුණුම I මගින් දැක්වේ.)

7.2.4.1.1 පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් හෝ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්.

7.2.4.2 වෘත්තිය පරීක්ෂණය - අදාළ නොවේ.

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය: අදාළ නොවේ.

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීම සඳහා සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | අදාළ නොවේ. |
| 2. පරිගණක සම්බන්ධ දැනුම | 15 | |
| 3. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව | 15 | |
| 4. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතා | 05 | |
| **එකතුව** | 50 | |

<u>සටහන</u>

ඉහත සඳහන් වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණයන් අනුලව, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටිය අනුමත කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ඇත.

7.2.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා: ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්

**7.2.5** අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**7.3 සීමිත බඳවා ගැනීම :**

**7.3.1** බඳවා ගන්නා ශ්‍රේණිය : **III ශ්‍රේණිය**

**7.3.2 සුදුසුකම් :**

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ධීවර විද්‍යාවට අදාළ විෂයන්ගෙන් උපාධියක් ලබා, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ධීවර පරීක්ෂක තනතුරෙහි ස්ථිර කර ඇති හා වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

ii. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ධීවර පරීක්ෂක තනතුරෙහි ස්ථිර කර ඇති හා වසර 10ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

7.3.2.2 වෘත්තීය සුදුසුකම් : අදාල නොවේ.

7.3.2.4 කායික සුදුසුකම්: සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.2.5 වෙනත්: පූර්වාසන්න වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**7.3.3** වයස : අදාල නොවේ.

**7.3.4** බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර කුසලතාවයේ අනුපිළිවෙල මත සුදුස්සන් තෝරාගනු ලැබේ.

7.3.4.1 **ලිඛිත විභාගය**

| **විෂයයන්** | **උපරිම ලකුණු ප්‍රමාණය** | **සමත් ලකුණු ප්‍රමාණය** |
|---|---|---|
| 1.බුද්ධි පරීක්ෂණය හා අභියෝග්‍යතාව | 100 | 40% |
| 2.ධීවර පනත හා රෙගුලාසි | 100 | 40% |
| 3. ධීවර කළමනාකරණය | 100 | 40% |

(විෂය නිර්දේශය **ඇමුණුම්** II වශයෙන් යා කර ඇත.)

7.3.4.1.1 පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් හෝ ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්.

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ.

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : (ලකුණු ලබා දෙනු නොලැබේ)

7.3.4.3.1. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :

ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්

7.3.4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ.

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : ප්‍රසිද්ධ අභ්‍යන්තර නිවේදනයක් මගින් සහ වෙබ් අඩවියේ පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

(14)

7.4 **කුසලතා පදනම මත බඳවා ගැනීම** - අදාළ නොවේ.

08. **කාර්යක්ෂමතා කඩඉම් :**

8.1

| **කුමන කාර්යක්ෂමතා කඩඉම්ද යනවග** | **කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද** | **කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත/වෘත්තීය/පහසුකරණ පාඨමාලා/වෙනත්** |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ගතවීමට පෙර | ලිඛිත |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස්වීමෙන් පසු වසර 03 ක් ගතවීමට පෙර | ලිඛිත |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස්වීමෙන් පසු වසර 05 ක් ගතවීමට පෙර | ලිඛිත |

විෂය නිර්දේශය **ඇමුණුම** III, IV,V යටතේ දැක්වේ.

8.2 පරීක්ෂණ පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද : වර්ෂයකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :

1 වන කාර්යක්ෂමතා කඩඉම : ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

2 වන කාර්යක්ෂමතා කඩඉම : ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

3 වන කාර්යක්ෂමතා කඩඉම : ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

09. **භාෂා ප්‍රවීණතාවය**

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 01 රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුල ලබා ගත යුතුය. |
| 02 අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 1/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාල මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය |

10. **ශ්‍රේණි උසස් කිරීම්**

**10.1** III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව,

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.

VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට, පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

**10.2** II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්ය සාධන අගැයීමේ පටිපාටිය අනුව උසස්කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව, ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

**10.3** I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම. : අදාළ නොවේ.

**සංලක්ෂය** සාමාන්‍ය මට්ටමේ කාරය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස් වීමේ දිනය කාර්යක්ෂමතා කඩඉම් සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුයි.

(12)

11. තනතුරු වලට පත් කිරීම. - අදාළ නොවේ

12. **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි :**

අදාළ නොවේ.

13. **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි: අර්ථ නිරූපන :**

සක්‍රිය සේවා කාලය යනු නිලධාරියා ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් සේ සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයක් හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. **ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :** අදාළ නොවේ

15. **සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාල වේ.**

16. **මෙම උසස් කිරීමේ පරිපාටියේ විධිවිධාන සලකා නොමැති යම් කරුණක් වේනොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.**

සකස් කළේ :-

අත්සන: .............................................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම :

තනතුර :

දිනය :

පරීක්ෂා කළේ :-

අත්සන.............................................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම :

තනතුර :

දිනය :

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : .............................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :- එම්. ක්‍රිස්ටි ලාල් ප්‍රනාන්දු

තනතුර :- අධ්‍යක්ෂ ජනරාල්

[illegible]

දිනය :

නිල මුද්‍රාව :-

යොමු අංකය :

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි ආශ්‍රිත සේවා ගණය (ධීවර නිලධාරී තනතුර) තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ......................................

නම : ඩබ්ලිව්.එම්.එම්.ආර්.අදිකාරි

ලේකම්,

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

දිනය : 29/4/16............

නිල මුද්‍රාව : ......................................

ඩබ්.එම්.එම්.ආර්. අදිකාරි
ලේකම්
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
නව ලේකම් කාර්යාලය
මාලිගාවත්ත, කොළඹ 10.

යොමු අංකය : PSC/EST/05-01-36/01/2015

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි ආශ්‍රිත සේවා ගණය (ධීවර නිලධාරී තනතුර) සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය 2015.08.04 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ......................................

නම : ......................................

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය :- 2016-05-05...

නිල මුද්‍රාව :- ......................................

එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ 05.

ඇමුණුම I

## විභාග/වෘත්තීය පරීක්ෂණ පිළිබඳ විස්තර

01. විභාගයේ / වෘත්තීය පරීක්ෂණයේ නම : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි ධීවර නිලධාරී තනතුරු සඳහා වන පුරප්පාඩු පිරවීම සඳහා වූ ලිඛිත පරීක්ෂණය පිළිබඳ ආකෘතිය.

02. විභාගය / වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| රචනය හා සාරාංශය | පැය 01 1/2 | 100 | 40% |
| සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40% |

03. පවත්වනු ලබන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් හෝ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් විභාග පවත්වනු ලැබේ.

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : අවශ්‍යතාවය පරිදි

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ තර්කානුකූල විචාරණ සහ විග්‍රහ ශක්තිය හා නිවැරදිව සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව, සාමාන්‍ය දැනුම හා බුද්ධිය පිළිබඳව මැනීම අරමුණු කොට ගෙන මෙය සම්පාදනය කරනු ලැබේ. මෙය ගණිත ගැටළු, සාමාන්‍ය දැනීම, පරිසරය හා ආශ්‍රිත ප්‍රශ්න ඇතුලත් බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. |
| 02. රචනය හා සාරාංශය | කාලීන සමාජීය සිදුවීමක් පිළිබඳ ප්‍රකාශයක් හෝ සාකච්ඡා සටහනක් කියවා අවබෝධකොට ගෙන විග්‍රහ කර දැක්වීම පිළිබඳ හැකියාව මැනීම හා රචනය/ සාරාංශකරණය කිරීමේ හැකියාව මැනීම පිළිබඳ ප්‍රශ්න පත්‍රයකි. |

| | |
|---|---|
| 03. සාමාන්‍ය දැනීම | ශ්‍රී ලංකාවේ මෙන්ම ලෝකයේ මූල්‍ය, ආර්ථික, වාණිජ, දේශපාලන, ජාත්‍යන්තර සබඳතා, කළමනාකරණ,විද්‍යා හා තාක්ෂණ, අධ්‍යාපන, සෞඛ්‍ය, ක්‍රීඩා, පරිසර, සමාජ හා සංස්කෘතික යන ක්ෂේත්‍රයන්හි වැදගත් සිද්ධීන් ද අදාලව විශේෂයෙන් දේශීය හා විදේශීය ධීවර ක්ෂේත්‍රය පිළිබඳ මූලික දැනීම මැන බැලීම සඳහා සකස් කරනු ලබන ප්‍රශ්න කිහිපයකට පිළිතුරු සැපයීම අපේක්ෂා කරනු ලැබේ. |

අත්සන : ..............................

(විෂයභාර කනිෂ්ඨ මාණ්ඩලික නිලධාරි)

නම :

තනතුර:

දිනය:

අත්සන : ..............................

(විෂයභාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි)

නම :

තනතුර:

දිනය: 2016 08' 04

අත්සන : ..............................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : එම්. ක්‍රිස්ටි ලාල් ප්‍රනාන්දු

තනතුර: අධ්‍යක්ෂ ජනරාල් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

දිනය : 2016 | 08 | 5

නිල මුද්‍රාව :

## විභාග/වෘත්තිය පරීක්ෂණ පිළිබඳ විස්තර

01. විභාගයේ / වෘත්තිය පරීක්ෂණයේ නම : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි ධීවර නිලධාරී තනතුරු සඳහා වන සීමිත බඳවා ගැනීම සඳහා වූ ලිඛිත පරීක්ෂණය පිළිබඳ ආකෘතිය.

02. විභාගය / වෘත්තිය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1.බුද්ධි පරීක්ෂණය හා අභියෝගතාව | පැය01 | 100 | 40% |
| 2.ධීවර පනත හා රෙගුලාසි | පැය 01 | 100 | 40% |
| 3.ධීවර කළමනාකරණය | පැය 01 | 100 | 40% |

03. පවත්වනු ලබන බලධරයා: විභාග කොමසාරිස් ජනරාල් හෝ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් විභාග පවත්වනු ලැබේ

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : අවශ්‍යතාවය පරිදි

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1.බුද්ධි පරීක්ෂණය හා අභියෝගතාව | අපේක්ෂකයාගේ තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය හා නිවැරදිව සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව, සාමාන්‍ය දැනුම හා බුද්ධිය පිළිබඳව මැනීම අරමුණු කොට ගෙන මෙය සම්පාදනය කරනු ලැබේ. මෙය ගණිත ගැටළු, සාමාන්‍ය දැනීම, පරිසරය හා ආශ්‍රිත ප්‍රශ්න ඇතුලත් බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. |
| 2.ධීවර පනත හා රෙගුලාසි | 1996 අංක 02 දරණ ධීවර හා ජලජ සම්පත් පනත<br>ධීවර හා ජලජ සම්පත් පනත යටතේ පනවා ඇති නියෝග<br>ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය<br>ධීවර සංවිධාන මූලධර්ම සහ ප්‍රතිපත්ති<br>උසාවි කාර්ය පටිපාටිය<br>ආශ්‍රිත ප්‍රශ්න ඇතුලත් බහුවරණ හා කෙටි ප්‍රශ්න ඇතුලත් ප්‍රශ්න පත්‍රයකි. |

| | |
|---|---|
| 3.ධීවර කළමනාකරණය | කළමනාකරණය පිළිබඳ මූලික අවබෝධය<br>ධීවර සම්පත් ප්‍රශස්ත භාවිතය හා තිරසාර ලෙස උපයෝගී කර ගැනීම උදෙසා වන ක්‍රමෝපායන්<br>මසුන් පරිහරණය හා පසු අස්වනු තාක්ෂණය<br>උසාවි කාර්ය පරිපාටිය<br>දත්ත එක්රැස් කිරීම හා විශ්ලේෂණය පිළිබඳ අවබෝධය |

අත්සන : ........................

(විෂයභාර කනිෂ්ඨ මාණ්ඩලික නිලධාරි)

නම :

තනතුර: [illegible]

දිනය:

අත්සන : ........................

(විෂයභාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි)

නම :
එච්.එස්.එස්. ගුණසේකර

තනතුර: අධ්‍යක්ෂ (කළමනා)
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන්
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

දිනය: [illegible]

අත්සන : ........................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : එම්. ක්‍රිස්ටි ලාල් ප්‍රනාන්දු
අධ්‍යක්ෂ ජනරාල්

තනතුර: ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

දිනය : 2016/1/15

නිල මුද්‍රාව :

## විභාග/වෘත්තීය පරීක්ෂණ පිළිබඳ විස්තර

01. විභාගයේ/ වෘත්තීය පරීක්ෂණයේ නම : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ධීවර නිලධාරි තනතුර සඳහා වන 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාගය/ වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. ආයතන කටයුතු හා මුදල් රෙගුලාසි | පැය 1 1/2 | 100 | 40% |
| 2. ධීවර පනත හා රෙගුලාසි | පැය 1 1/2 | 100 | 40% |

03. පවත්වනු ලබන බලධරයා : ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂයය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන කටයුතු හා මුදල් රෙගුලාසි | **ආයතන සංග්‍රහය**<br>XXVII වන පරිච්ඡේදය : ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග<br>XXXI වන පරිච්ඡේදය- : සමිති සමාගම් පවත්වාගෙන යාමේ සහ :අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිවාසිකම් භුක්ති විඳීම<br>XXXII වන පරිච්ඡේදය : දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීම<br>XLVIII වන පරිච්ඡේදය :විනය කාර්ය පරිපාටිය පිළිබඳ රීති<br><br>**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහය**<br>III වන පරිච්ඡේදය :පත් කිරීම<br>IV වන පරිච්ඡේදය :සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පරිපාටි<br>VI වන පරිච්ඡේදය :පත්කිරීම් කෙරෙහි බලපාන නියමයන් හා කොන්දේසි<br>VIII වන පරිච්ඡේදය :පරිවාස කාලය, වැඩ බැලීමේ කාලය හා පත්වීම ස්ථිර කිරීම<br><br>මුදල් රෙගුලාසි 01 සිට 68 දක්වා<br>මුදල් රෙගුලාසි 124 සිට 147 දක්වා |

| | |
|---|---|
| ධීවර පනත හා රෙගුලාසි | 1. (අ) ධීවර හා ජලජ සම්පත් පනතේ විධිවිධාන සම්බන්ධ මූලික දැනුම<br>(ආ). ධීවර මෙහෙයුම් සඳහා බලපත්‍ර දීම පිළිබඳ සම්බන්ධ මූලික දැනුම<br>(ඇ). මසුන් සහ වෙනත් ජලජ සම්පත් ආරක්ෂා කිරීම පිළිබඳ විධිවිධාන සම්බන්ධ මූලික දැනුම<br>11. වරින් වර සකසා ඇති ධීවර නියෝග සම්බන්ධ මූලික දැනුම<br>111. ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සම්බන්ධ මූලික දැනුම |

සකස් කළේ :

අත්සන: ..............................

නම :

තනතුර : [illegible]

දිනය :

පරීක්ෂා කළේ :

අත්සන: ..............................

නම : එච්.එස්.එස්. ප්‍රසන්න
අධ්‍යක්ෂ (පාලන)

තනතුර [illegible]

දිනය : [illegible]

අත්සන : ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :-
එම්. ත්‍රිස්ටි ලාල් ප්‍රනාන්දු

තනතුර :-

නිල මුද්‍රාව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

දිනය :- 2016/7/26

ඇමුණුම IV

## විභාග/වෘත්තිය පරීක්ෂණ පිළිබඳ විස්තර

01.විභාගයේ/වෘත්තිය පරීක්ෂණයේ නම : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ධීවර නිලධාරි සේවයේ 2 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02.විභාගය/වෘත්තිය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. 1996 අංක 02 දරණ ධීවර හා ජලජ සම්පත් පනත පිළිබඳ ප්‍රශ්න පත්‍රය | පැය 02 | 100 | 40% |
| 2. දෙපාර්තමේන්තු නියෝග, චක්‍රලේඛ හා උපදෙස් ප්‍රශ්න පත්‍රය | පැය 02 | 100 | 40% |

03.පවත්වනු ලබන බලධරයා : ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගි

04.පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1996 අංක 02 දරණ ධීවර හා ජලජ සම්පත් පනත පිළිබඳ ප්‍රශ්න පත්‍රය | I. 1996 අංක 02 දරණ ධීවර හා ජලජ සම්පත් පනත<br>II. ධීවර හා ජලජ සම්පත් පනත යටතේ පනවා ඇති නියෝග හා පනතින් පරිච්ඡින්න නොකරන ලද නියෝග.<br>III. ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය<br>IV. ධීවර සංවිධාන මූලධර්ම සහ ප්‍රතිපත්ති<br>V. උසාවි කාර්ය පරිපාටිය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම |

16.17

| | |
|---|---|
| දෙපාර්තමේන්තු නියෝග, චක්‍රලේඛ හා උපදෙස් ප්‍රශ්න පත්‍රය | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය මගින් වරින් වර නිකුත් කර ඇති සියළුම වලංගු නියෝග චක්‍රලේඛ හා උපදෙස් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම |

සකස් කළේ :

අත්සන: ........................

නම :

තනතුර :

දිනය :

පරීක්ෂා කළේ :

අත්සන: ........................

නම : එච්.එල්.එස්. ප්‍රසන්නා

තනතුර :

දිනය : 2016/01/04

අත්සන : ........................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :- එම්. ක්‍රිස්ටි ලාල් ප්‍රනාන්දු

තනතුර :- ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

දිනය :- 2016/1/15

නිල මුද්‍රාව :

ඇමුණුම V

## විභාග/වෘත්තීය පරීක්ෂණ පිළිබඳ විස්තර

01. විභාගයේ/වෘත්තීය පරීක්ෂණයේ නම : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ධීවර නිලධාරී තනතුර සඳහා වන 3 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාගය/වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. උසාවි කාර්ය පටිපාටිය | පැය 02 | 100 | 40% |
| 2. ධීවර සංවිධාන ප්‍රතිපත්ති | පැය 02 | 100 | 40% |
| 3. දෙපාර්තමේන්තු නියෝග | පැය 02 | 100 | 40% |

03. පවත්වනු ලබන බලධරයා : ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| උසාවි කාර්ය පටිපාටිය | I. ධීවර හා ජලජ සම්පත් පනතේ VII වන කොටස - බලයලත් නිලධරයන් සහ ඔවුන්ගේ බලතල සම්බන්ධ දැනුම<br>II. IX වන කොටස - වැරදි සහ දණ්ඩන සම්බන්ධ දැනුම<br>III. X වන කොටස- සම්බන්ධ දැනුම<br>IV. උසාවි කාර්ය පටිපාටිය පිළිබඳ දැනුම<br>V. අධිකරණ බල ප්‍රදේශය<br>VI. අධිකරණය වෙත පැමිණිලි ඉදිරිපත් කළයුතු ආකාරය සහ ඒ සමග ඉදිරිපත් කළ යුතු ලේඛන<br>VII. වරෙන්තු පිළිබඳ පිළිවෙත<br>VIII. සාක්ෂි ආඥා පනත පිළිබඳ දැනුම<br>IX. ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක පරිසර නීතිය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම. |
| ධීවර සංවිධාන ප්‍රතිපත්ති | I. ධීවර සංවිධාන මූලධර්ම සහ ප්‍රතිපත්ති<br>II. ලංකාවේ ධීවර සංවිධාන පිහිටුවීමේ මූලික පරමාර්ථ<br>III. ලංකාවේ ධීවර සංවිධාන සමිති ඉතිහාසය<br>IV. ධීවර සංවිධාන සමිති වල ක්‍රියාකාරීත්වය, බල ප්‍රදේශය හා සාමාජිකත්වය<br>V. ධීවර සංවිධාන සමිතියක අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය, බලතල හා වගකීම් |

| | |
|---|---|
| | VI. ධීවර සංවිධාන සමිති ව්‍යවස්ථාව<br>VII. ධීවර සංවිධාන වත්කම් හා වගකීම්<br>VIII. ධීවර සංවිධානයක කාරක නියෝග<br>IX. ධීවර අමාත්‍යාංශය හා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව ධීවර සංවිධානයට සම්බන්ධ වන අයුරු<br>X. ධීවර සංවිධාන සමිතියක ගිණුම් ක්‍රම |
| දෙපාර්තමේන්තු නියෝග | I. 1996 අංක 02 දරණ ධීවර හා ජලජ සම්පත් පනත යටතේ පනවා ඇති නියෝග<br>II. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය මඟින් වරින් වර නිකුත් කර ඇති සියළුම වලංගු නියෝග චක්‍රලේඛ හා උපදෙස් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම. |

සකස් කළේ :-

අත්සන: ..........................

නම :

තනතුර :

දිනය :

පරීක්ෂා කළේ :

අත්සන: ..........................

නම :

තනතුර :

දිනය : 2016.01.04

අත්සන : ..........................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :- එම්. ක්‍රිස්ටි ලාල් ප්‍රනාන්දු

තනතුර : අධ්‍යක්ෂ ජනරාල් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

දිනය : 2016/1/15

නිල මුද්‍රාව :-